# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2200/3 - 2020 නොවැම්බර් මස 04 වැනි බදාදා - 2020.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 70

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු/මෝල් හිමියෙකු විසින් පහත දක්වා ඇති සහල් වර්ග එහි සඳහන් කර ඇති උපරිම මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ වෙළඳාම කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම මිළ* |
|---|---|
| සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/ තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑම් 1ක් රු. 94/- |
| සුදු/රතු කැකුළු සම්බා | කිලෝග්‍රෑම් 1ක් රු. 94/- |
| සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/ තම්බන ලද (මොට්ටෙයිකරුපන් සහ අට්ටික්කාරී හැර) | කිලෝග්‍රෑම් 1ක් රු. 92/- |
| සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑම් 1ක් රු. 89/- |

මෙම නියෝගය 2020 නොවැම්බර් මස 04 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),
සභාපති.

2020 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 2804 — 220 (2020/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*